



# ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ශ්‍රමිකයන් සඳහා වූ ජාතික ප්‍රතිපත්තියක් සඳහා නිර්දේශ

(ගෘහස්ථ ශ්‍රමිකයින්, ඔවුන් නියෝජනය කරන ආයතන, රජය, පෞද්ගලික අංශ, රාජ්‍ය නොවන සංවිධාන හා සිවිල් සමාජ සංවිධාන සමග සාකච්ඡා කොට ''හෝම්නෙට් ශ්‍රී ලංකා'' ආයතනය විසින් සකස් කරන ලදි.)

## 01. හැදින්වීම

ශ්‍රී ලංකාවේ ගෘහස්ථ ශ්‍රමිකයන් (Home Based Workers) වන්නේ වැඩි ප්‍රතිශතයක් කාන්තාවන් නියෝජනය කරන පහසුවෙන්ම අවදානමට ලක්වීමට ඉඩ ඇති ප්‍රජාවකි. ජාතික ආර්ථිකයට ගෘහස්ථ ශ්‍රමිකයන් ගෙන් සිදුවන දායකත්වය සාපේක්ෂව ඉහළ මට්ටමක පැවැතුනද එය ගුණාත්මකව හෝ ප්‍රමාණාත්මකව පිළිගැනීමට ලක්වී නොමැත. රටක සමස්ථ ජාතික සංවර්ධනය සඳහා ගෘහස්ථ ශ්‍රමිකයින්ගේ සමාජ ආර්ථික දියුණුව අතිශය වැදගත් වේ.

සියලු දෙනාටම සමාජ සංවර්ධනයේ ප්‍රතිලාභ ලගාකර දිමට හා බහුවිධ ස්වාභාවයෙන් යුත් දරිද්‍රතාවය අඩුකිරීමට ආර්ථික වර්ධනය අත්‍යවශ්‍ය වුවද එය පමණක් තිබීම ප්‍රමාණවත් නොවේ. ඕනෑම සමාජයක විශේෂයෙන් දියුණුවෙමින් පවතින රටවල් වල සියලු ජනතාව වෙත ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ ලගාකර දිම සඳහා ගෘහස්ථ ශ්‍රමිකයන්ට විවිධ හා වටිනා තේරුම් හා අවස්ථා ලගාකර දිය හැකි වු වඩාත් යෝග්‍ය හා පහසුකම් සලසා දෙන පරිසරයක් නිර්මාණය කිරිම අතිශය වැදගත් වේ. ගෝලීය ආර්ථික පරිසරය තුල ගෘහස්ථ ශ්‍රමිකයින් ගෝලීය ආර්ථික වටිනාකම් ජාලයේ කොටසක් බවට ලක් වී ඇත.

විශාල සමාගම් හා ගෝලීය තරඟකාරීත්වය බිහි වීමත් සමඟ මෙම ඉතා කුඩා ව්‍යවසායකයින්ට තර්ජන හා නොයෙකුත් බාධා වලට මුහුණදීමට සිදු වී ඇත. ගෘහස්ථ ශ්‍රමිකයින්ට ගෝලීයකරණය නිසා බිහි වි ඇති අවදානම් තත්වය අවම කරමින් එහි ප්‍රතිලාභ ලබා දිමට කටයුතු කිරිම මෙම ප්‍රතිපත්ති නිර්දේශවල ඉලක්කයයි.

මෙම ගෝලීය ලිබරල් හා විවෘත ආර්ථික පරිසරය තුල සමස්ථ ලෝකය පුරා විධිමත් රැකියා හා වෘත්තීය සමිති සාමාජිකත්වය අඩු වි අවිධිමත් ආර්ථිකය වැඩි වීමේ තත්වයක් නිර්මාණය වි ඇති අතර කම්කරු ව්‍යාපාරයේ අනාගතය බොහෝ විට රඳා පවතින්නේ ගෘහස්ථ ශ්‍රමිකයින් ඇතුලත්ව වැදගත් අංශයක් වන අවිධිමත් ආර්ථිකය සංවිධානය කිරීමේ හැකියාවමතය.

## 02 පසුබිම

සියලුම භූගෝලීය ප්‍රදේශ ආවරණය කරන සියළුම කර්මාන්ත පාහේ නියෝජනය කරනු ලබන ගෘහස්ථ ශ්‍රමිකයින් විවිධ පසුබිම් වලට අයත්ය. නාගරික මෙන්ම ග්‍රාමීය ප්‍රජාව නියෝජනය කරන ගෘහස්ථ ශ්‍රමිකයින් සාම්ප්‍රදායික මෙන්ම නව ආර්ථික අංශ වලට සම්බන්ධ වි ඇත. අනෙකුත් රටවල මෙන්ම ශ්‍රී ලංකාවද ගෘහස්ථ ශ්‍රමිකයින් ගෙන් විශාල ප්‍රතිශතයක් වන්නේ කාන්තාවන්ය.

1996 ජිනීවා හි පැවැති ජාත්‍යයන්තර කම්කරු සංවිධානය (ILO) 20 වන සැසි වාරයේ දි ගෘහස්ථ ශ්‍රමය (Home Work) පිළිබඳ වු සම්මුතිය (අංක 177) හා නිර්දේශ (අංක 184) පිළිගන්නා ලදි. මෙම සම්මුති හා නිර්දේශ ගෘහස්ථ ශ්‍රමිකයින් ගේ මූලික සමාජ සුරක්ෂිතතාවය (Basic Protection) ලබා දීම හා ඒ සඳහා සියලුම රටවල ජාතික ප්‍රතිපත්ති සකස් කර පිළිගැනිම, ක්‍රියාත්මක කිරිම හා කාලින සංශෝධන ඇති කිරිම ඉලක්ක කර ඇත. මෙම ලේඛන දෙක ගෘහස්ථ ශ්‍රමිකයින් ගේ සෞඛ්‍ය ආරක්ෂාව, සමාජ සුරක්ෂිතභාවය හා සුභ සාධනය ආදිය ලබාදිම ඉලක්ක කර ඇත.

2000 දී ශ්‍රී ලංකාව විසින් අත්සන් තැබු කත්මන්ඩු ප්‍රකාශනය සියලුම රටවල ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමේ අවශ්‍යතාවය අවධාරණය කරන ලදී. එහිදී ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා සංවිධානය වීමේ අයිතිය, අවම වැටුප් වෘත්තිය සෞඛ්‍ය හා ආරක්ෂාව(OHS), සමාජ සුරක්ෂිතභාවය, මාතෘ රැකවරණය, ළමා කුසලතා සංවර්ධනය ඇතුලත් අවම රැකවරණය ලබා දීමට එකඟ වී ඇත.

ගෘහස්ථ ශ්‍රමිකයින් නිර්වචනය කිරීම ඉතා ක්‍රියාවන් වන අතර විවිධ රටවල් සඳහා වූ ස්වකීය නිර්වචනයන්ගේ අවශ්‍යතාවයද දැකිය හැක. සාමාන්‍ය අදහසින් ගෘහස්ථ ශ්‍රමිකයින් වනුයේ, තමන් විසින් නිෂ්පාදනය කරනු ලබන භාණ්ඩ හෝ ආර්ථික වටිනාකමක් ඇති සේවාවන් ලබා දෙන, පුද්ගලයන්ට අයත් නොවන ස්ථානයක වූ තම නිවසේ හෝ ආසන්න වූ ස්ථානයක වැඩ කරන, එහෙත් විධිමත්ව රැකියාගත නොවී ඇති පුද්ගලයින්ය.

සාමාන්‍යයෙන් ගෘහස්ථ ශ්‍රමික කටයුතු මුළු පවුල විසින්ම සම්බන්ධ වී සිදු කරනු ලබන අතර බොහෝ විට ළමයින්ද යොදා ගැනේ.

ලෝක කම්කරු සංවිධානයේ සම්මුති අංක 177 (ILO C 177) (ගෘහස්ථ ශ්‍රමය පිළිබඳ සම්මුතිය - Home Work Convention 1996) විසින් ගෘහස්ථ ශ්‍රමය නිර්වචනය කර ඇත්තේ ''සේව්‍යාගේ වැඩ බිමට අයත් නොවන, තම නිවසේ හෝ තමාගේ කැමැත්තට අනුව

තෝරා ගත් ස්ථානයක, අමුද්‍රව්‍ය හා උපකරණ මෙන්ම අනෙකුත් යෙදවුම් ලබා දෙන්නේ කවුරුන්ද යන්න සැලකිල්ලට නොගෙන සේව්‍යයා විසින් නිර්දේශිත භාණ්ඩ හෝ සේවාවන් ලබා දීම සඳහා, වැටුපක් ලබා ගෙන ගෘහස්ථ ශ්‍රමිකයා (Home Based Worker – HBW) විසින් කරනු ලබන ශ්‍රම කටයුතුය.''

සේව්‍යයා (Employer) යනු: සිය කටයුතු ඉටුකර ගැනීම සඳහා සෘජුව හෝ රටේ නීතියෙන් ඉඩ ප්‍රස්ථාව ලබා දී ඇති හෝ නොමැති, අතර මැදියකු හරහා ගෘහ ශ්‍රමික කටයුතු කරනු ලබන, ස්වාභාවික හෝ නීතිමය පුද්ගලයකු ලෙස නිර්වචනය කල හැක. ලෝක කම්කරු සංවිධානයේ නිර්වචනයට අනුව: විශේෂයෙන්ම නිෂ්පාදන ඒකකයකට කරනු ලබන ගෙවීම් මත පදනම්ව ශ්‍රම සැපයුම කරන්නන් ගෘහස්ථ ශ්‍රමිකයන් ලෙස දැක්වේ. එහිදී සෘජුව වෙළඳ පොළ සඳහා නිෂ්පාදනය කරන අය අයත් නොවේ.

ශ්‍රී ලාංකේය සන්දර්භය තුල ගෘහස්ථ ශ්‍රමිකයන් නිර්වචනය කර ඇත්තේ, ''සෘජුව වෙළඳ පොළට හෝ සේව්‍යයාගේ වැඩ බිමට අයත් නොවන තම නිවසේ හෝ තමාගේ කැමැත්තට අනුව තොරාගත් ස්ථානයක අමුද්‍රව්‍ය, උපකරණ හා යෙදවුම් ලබා දෙන්නේ කවුරුන්ද යන්න සැලකිල්ලට නොගෙන සේව්‍යයා විසින් නිර්දේශිත භාණ්ඩ හෝ සේවාවන් ලබා දීම සඳහා වැටුපක් ලබාගෙන සේව්‍යාට ලබා දීම හෝ යම් භාණ්ඩයක් හෝ සේවාවක් ලබා දීමට නිෂ්පාදන කටයුත්තක යෙදී සිටින්නන් ලෙසය.''

ශ්‍රී ලාංකීය තත්ත්වය තුල සිය නිවෙස් තුල සිදු කරනු ලබන කෘෂිකර්මය පදනම් වී ඇති ආදායම් උත්පාදන ක්‍රියාවලියන්ද ගෘහස්ථ කර්මාන්ත (Home Based Industries) ලෙස හඳුනාගෙන ඇත.

ශ්‍රී ලාංකීය ගෘහස්ථ ශ්‍රමිකයන් ඔවුන් විසින් මුහුණ දෙනු ලබන බහු විධ දුප්පත්කම තුල සිය ජීවත් වීමට හා ආදායම් ඉපයීමට හෝ රැකියාවක් කිරීමට ඇති අයිතිය පිළිබඳ සැලකීමේදී විවිධ අභියෝග හා ගැටළු වලට මුහුණ දී සිටිති.

- අඩු ආදායම.
- දේපල පදනමක් නොමැති වීම.
- සාක්ෂරතාව නොමැති වීම.
- සෞඛ්‍ය ගැටළු .
- ස්ත්‍රී පුරුෂ අසමානතාව.
- ළමා ශ්‍රමය.
- පාරිසරික හානි.
- ගෝලීයකරණ අභියෝග.
- නීතිමය රැකවරණ ප්‍රමාණවත් නොවීම.
- සාම්ප්‍රදායික දැනුම හා කුසලතා වලට ඇති තර්ජන.

ගෘහස්ථ ශ්‍රමිකයින්ගේ බහුවිධි ප්‍රශ්න විසඳීම සඳහා රජය, පෞද්ගලික හා සිවිල් සංවිධාන දැනට හුදෙකලා වී වෙන් වෙන් වශයෙන් යම් ක්‍රියා මාර්ග ගනු ලබන අතර, මෙම අංශය දියුණු කිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් හා බහුපාර්ශවීය සහයෝගීතාවයකින් යුත් ඒකාබද්ධ ප්‍රවේශයක් දැඩිව අවශ්‍ය වී ඇත.

ගෘහස්ථ ශ්‍රමය පිළිබඳ මෙම ජාත්‍යන්තර සම්මුතිය මගින් ගෘහස්ථ ශ්‍රමිකයින් හා අනෙකුත් වේතන ලබන ශ්‍රමිකයින් අතර සමාන ලෙස සැලකීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම අවධාරණය කරන අතර එහිදී සමාන සැලකීම් කළයුතු පහත දැක්වෙන අංශ විශේෂයෙන් දක්වා ඇත.

- සංවිධාන පිහිටුවීමට හා තම කැමැත්ත මත එවැනි සංවිධාන වලට බැඳීමට හා එවැනි සංවිධාන වල ක්‍රියාකාරකම් වලට සහභාගී විමට ඇති අයිතිය.
- රැකියාවේදී හෝ වෘත්තිය කටයුතු වලදී සිදු විය හැකි අසමාන ලෙස සැලකීමට එරෙහිව රැකවරණය.
- වෘත්තිය සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ අංශවල රැකවරණය, ගෘහස්ථ ශ්‍රමිකයින් පිළිබඳ නීති හා රෙගුලාසි ක්‍රියාත්මක කිරීම, සෞඛ්‍ය හා ආරක්ෂාව පිළිබඳ හේතූ නිසා සමහර උපකරණ, ද්‍රව්‍ය භාවිතය හා සමහර ගෘහශ්‍රමය තහනම් කිරීම.
- වැටුප් ගෙවීම.
- ව්‍යවස්ථාපිත සමාජ සුරක්ෂණයන්ගෙන් රැකවරණය ලබා දීම.
- ගෘහ ශ්‍රමය තුල ළමා ශ්‍රමය භාවිතය වැලැක්වීම සඳහා ඇතුළත් වීමේ අවම වයසක් ඇති කිරීම.
- මාතෘ රැකවරණය - විශාල ප්‍රතිශතයක් කාන්තාවන් වන ගෘහ ශ්‍රමිකයන් ගේ මූලික අවශ්‍යතාවයක්.

ලෝක කම්කරු සංවිධානයේ ලේඛන - මෙවලම්, සහ විශේෂයෙන්ම සම්මුතීන් ජාතික ප්‍රතිපත්තියක් හෝ ජාතික ප්‍රතිපත්ති වලට සහාය දක්වන ජාතික නීති පද්ධති සඳහා ජාත්‍යන්තර තත්ත්වය පිළිබඳ මාර්ගෝපදේශවේ.

ගෘහස්ථ ශ්‍රමිකයන්ගේ තත්ත්වය දියුණු කිරීම සඳහා ගෘහස්ථ ශ්‍රමය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සකස් කර පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම හා කාලීන ලෙස ඉදිරිපත් කිරීම ගෘහ ශ්‍රමය පිළිබඳ සම්මුතිය පරානුමත (Ratify) කරනු ලබන රටවල් විසින් සිදු කිරීම අපේක්ෂා කරනු ලබයි. මේ සඳහා ගෘහස්ථ ශ්‍රමිකයන් හා ඔවුන්ගේ සේව්‍යයන් නියෝජනය කරනු ලබන සංවිධාන පවතී නම් ඔවුන්ගේ වැඩි නියෝජනයක් සහිත සංවිධාන සමඟ සාකච්ඡා කිරීම තුළින් කටයුතු සිදු කළ යුතුය. නීති හා රෙගුලාසි, සාමූහික ගිවිසුම්, හෝ ජාතික භාවිතයට එකඟ වන ඕනෑම යෝග්‍ය ආකාරයකට මෙම ගෘහස්ථ ශ්‍රමය පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කල යුතු බව මෙම සම්මුතියෙන් ප්‍රකාශ කරනු ලබයි.

ගෘහශ්‍රමය පිළිබඳ සම්මුතිය පරානුමත කරනු ලබන රජයන් පහත දැක්වෙන කරුණු අඩංගු ප්‍රතිපත්ති ඉටු කිරීමට බැඳී සිටී.

- ගෘහ ශ්‍රමයේ සමාජ හා ආර්ථික වටිනාකම පිළිගැනීම.

- වැඩිවන ආදායම් හා සමාජ සුරක්ෂණය තුලින් සමාජයේ පහළ ස්ථර වල සිටින අයගේ ජීවන මට්ටම ක්‍රමානුකූලව ඉහල දැමීම පදනම් වූ, දුප්පත් කම නැති කිරීමේ ඵලදායක උපායමාර්ගයක් තිබීම.
- පොදු මහජනතාවගේ මිලදී ගැනීමේ ශක්තිය ඉහළ නැංවීම තුලින් අභ්‍යන්තර ඉල්ලුම ශක්තිමත් කිරීම පදනම් වූ ප්‍රගතිශීලි හා ස්ථිර සාර සංවර්ධන උපායමාර්ගයක් තිබීම.
- කම්කරු පංතියට සිය අයිතිවාසිකම් භුක්ති විදීම සඳහා හැකියාව ලබා දෙන සුභවාදී මානව අයිතිවාසිකම් ප්‍රතිපත්තියක් තිබීම.
- මිලියන ගණනක් කාන්තාවන් සවිබලගැන්වීම තුලින් හා සිය සංවිධාන තුලින් ස්වාධීනව, ආරක්ෂිතව හා ගෞරවනීය ලෙස ජීවත්වීම සඳහා කාන්තාවන්ට ඉඩ සලස්වන ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ ධනාත්මක ප්‍රතිපත්තියක් තිබීම.

**03 දැක්ම**

ගෘහස්ත ශ්‍රමිකයන්ට වඩා හොඳ ජීවිතයක්.

**04 මෙහෙවර**

අවම සමාජ සුරක්ෂිත භාවය ලබා දිම මුලිකව සහතික කරන සියලු ආකාරයේ අසමාන ලෙස සැලකීම් හා සුරාකෑම් වලින් තොර සමාන හා සධාරණ සැලකිම සහිත ඵලදායක තරගකාරී ශ්‍රම සැපයිමක් හරහා,

- ජාතික ආදායම වැඩි කිරීමට වඩාත් දායකවීම
- දුප්පත් කමට එරෙහිව සටන් කිරීම
- ගෘහස්ථ ශ්‍රමිකයන් සවිබල ගන්වා අවසානයේදි සැමට වඩාත් හොද පිවිතයක් ලබා දිමට පහසුකම් සැලැස්වීම

**05 අභිමතාර්ථ**

- ගෘහස්ථ ශ්‍රමිකයන්ගේ ආදායම් ඉපයීම දියුණු කිරීම තුලින් සමස්ථ ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ ලබා ගැනිමට අවස්ථාව සැලසීම.
- සියලුම ආකාරයේ අසමාන ලෙස සැලකිම හා සුරාකෑම් වලින් ගෘහස්ථ ශ්‍රමිකයින් නිදහස් කිරීමට කටයුතු කිරීම හා ගෘහ ශ්‍රමය තුල ස්ත්‍රී පුරුෂ භාවය හා ජනවාර්ගික සමාජභාවය පවත්වා ගැනිම.
- වෙළඳපොළට, මුල්‍ය සම්පත් වලට විද්‍යා හා තාක්ෂණයට, අධ්‍යාපනයට හා පුහුණුවට, තොරතුරු හා දැනුමට වඩාත් සෘජු දැරිය හැකි හා හොඳ ප්‍රවේශයක් ලබා දිම හා පහසුකම් සැලැස්විම.
- සියළු අකාරයේ ප්‍රචණ්ඩත්වය හා උපද්‍රව හීන කරනු ලබන මාර්ග නැති කර, වෘත්තිය සෞඛ්‍ය හා ආරක්ෂාව සහතික කර ගෘහශ්‍රමය වඩාත් ශිෂ්ඨ හා ගරු කටයුතු හා පිළිගත හැකි තත්වයට පත් කිරීම සඳහා සුභ සාධනය, සමාජ සුරක්ෂිතභාවය හා සේවා ස්ථනයේ පහසුකම් දියුණු කිරීම හා පහසුකම් සැලැස්වීමේ ක්‍රියාවන් ගැනිම.
- ජාතික ආර්ථිකය තුල ගෘහස්ථ ශ්‍රමිකයන් හා ඔවුන්ගේ දායකත්වට නිසිලෙස පිළිගැනිමට කටයුතු කිරීම හා ඒ සඳහා පහසුකම් සැලැස්විම.
- ගෘහස්ථ ශ්‍රමිකයන් සඳහා ව්‍යවස්ථාමය රැකවරණය ලබාදීම.
- පාලනය විවිධ මට්ටම් නියෝජනය සඳහා ගෘහස්ථ ශ්‍රමිකයන් ප්‍රවර්ධනය කිරිම.
- ආපදාවලදී ගෘහස්ථ ශ්‍රමිකයන්ට වඩාත් ශක්තිමත්ව මුහුණ දිම සඳහා කටයුතු කිරිම.
- ගෘහස්ථ කර්මාන්තවල යෙදිම සඳහා කාන්තාව සවිබල ගැන්වීම.
- ගාහස්ථ කර්මාන්තවල දැකිය හැකි සියලු ආකාරයේ ළමා ශ්‍රමය නැති කිරීම සඳහා කටයුතු කිරීම.

**උපාය මාර්ග තේමා,**

i. සමාජ සුරක්ෂණය.
ii. වෙළඳපොළ ප්‍රවේශය.
iii. මුල්‍ය සම්පත් වලට හා අමුද්‍රව්‍ය වලට ඇති ප්‍රවේශය.
iv. සේවාස්ථානය (නිවස), යටිතල පහසුකම් හා භෞතික සම්පත් වෘත්තිය සෞඛ්‍යය හා ආරක්ෂණය.
v. අධ්‍යාපනය හා පුහුණුව සඳහා වු ප්‍රවේශය.
vi. විද්‍යා තාක්ෂණය දැනුම හා තොරතුරු සඳහා වු ප්‍රවේශය.
vii. ගෘහස්ථ ශ්‍රමිකයන් පිළිගැනිම.
viii. ගෘහස්ථ ශ්‍රමිකයින් සංවිධානය කිරීම හා ජාලගත කිරීම.
ix. ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා සම්බන්ධතා හා පාර්ශවකාරීත්ව ගොඩනැගිම.
x. කාන්තා සවිබල ගැන්වීම.
xi. ආපදා සඳහා පෙර සූදානම.
xii. ළමා ශ්‍රමය.

**i සමාජ සුරක්ෂණය**

- මරණ හා ආබාධිත ප්‍රතිලාභ, මාතෘ ප්‍රතිලාභ, වයස්ගතවීමේ විශ්‍රාමික සෞඛ්‍ය රැකවරණය හා ළමා ආරක්ෂාව ඇතුළු අනෙකුත් යෝග්‍ය පහසුකම් ලබාදීම සහතික කරනු ලබන සමාජ සුරක්ෂණ යාන්ත්‍රණයන් හඳුන්වා දීම සඳහා පහසුකම් සැලසීම හා ප්‍රවර්ධනය.
- දැනට පවතින සමාජ සුරක්ෂණ ක්‍රම ගෘහස්ථ ශ්‍රමිකයන් සඳහා දිගු කිරීමට සාකච්ඡා කර කටයුතු කිරීම.
- රැකියා සඳහා වේතනයක් සහතික කිරීම ප්‍රවර්ධනය කිරීම.

### ii වෙළඳපොල ප්‍රවේශය

- ගෘහස්ථ ශ්‍රමිකයන්ට වෙළඳ පොළට ඇති ප්‍රවේශය වැඩි දියුණු කිරීමට විශේෂ ප්‍රදර්ශන වෙළඳපොලවල් හා වෙළඳ මධ්‍යස්ථාන පැවැත්වීමට සැලැස්වීම හා ප්‍රවර්ධනය කිරීම.
- මිලදී ගන්නන් සමඟ රැස්වීම් හා සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම.
- වෙළඳ පොළවල් හා වෙළඳ මධ්‍යස්ථාන තුල ගෘහස්ථ ශ්‍රමිකයන් සඳහා විශේෂ මධ්‍යස්ථාන ඇති කිරීම හා ප්‍රවර්ධනය.
- විවිධ ගෘහස්ථ ශ්‍රමික පර්ෂදයන් සඳහා වෙළඳ තොරතුරු මධ්‍යස්ථාන සංවර්ධනය කිරීම.
- අලෙවි හා තාක්ෂණික සහාය ලබා ගැනීම සඳහා වෙළඳ මණ්ඩල සමග සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම.
- ගෘහස්ථ ශ්‍රමිකයන්ට වඩා හොඳ වෙළඳ පොළ ප්‍රවේශයක් සඳහා තොරතුරු හා සංනිවේදන තාක්ෂණය භාවිතය හා ප්‍රවර්ධනය කිරීම.
- විශේෂ ප්‍රවර්ධනයක් ලෙස රජයේ හා තෝරාගත් විශේෂ මධ්‍යස්ථාන වල ගෘහස්ථ ශ්‍රමිකයන් ගේ නිෂ්පාදන හා සේවා ලබා ගැනීම ප්‍රවර්ධනය කිරීම.
- ගෘහස්ථ ශ්‍රමිකයන් ගේ නිෂ්පාදන හා සේවාවාලට විශේෂ බදු සහන ලබා ගැනීමටත් ආනයන හා අපනයන බදු වලින් නිදහස් කර ගැනීමටත් බලධාරීන් සමඟ සාකච්ඡා කිරීම.
- ගෘහස්ථ ශ්‍රමිකයන්ගේ නිෂ්පාදන හා සේවා අලෙවි කිරීම සඳහා ශක්තිමත් සමාගම් සමග ව්‍යාපාර සහයෝගිතාවය පුනර්ජීවනය කිරීම.
- ගෘහස්ථ ශ්‍රමිකයන්ගේ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම සඳහා කලාපීය අළෙවි ජාලයන් සමඟ සම්බන්ධ වී කටයුතු කිරීම.
- ගෘහස්ථ ශ්‍රමිකයින්ගේ භාණ්ඩ වලට සහය දීම සඳහා රජයේ දැනට පවතින වෙළඳ ප්‍රවර්ධන ක්‍රියා දාමයන් සමඟ සම්බන්ධතා ගොඩනැගීමට කටයුතු කිරීම.
- ගෘහස්ථ ශ්‍රමිකයින්ගේ සාමූහික ව්‍යාපාර ප්‍රවර්ධනය කිරීම.

### iii මූල්‍ය සම්පත් වලට හා අමුද්‍රව්‍ය වලට ඇති ප්‍රවේශය

- ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා වඩාත් යෝග්‍ය වූ ක්ෂුද්‍ර ණය හා ක්ෂුද්‍ර මූල්‍ය ප්‍රවර්ධනය කිරීම.
- ගෘහස්ථ ශ්‍රමිකයින්ගේ අමුද්‍රව්‍ය අවශ්‍යතාවයන් සඳහා සාමූහික කේවල් කිරීම් ප්‍රවර්ධනය කිරීම.

### iv සේවාස්ථානය (නිවස), යටිතල පහසුකම්, භෞතික සම්පත් වෘත්තිය සෞඛ්‍යය හා ආරක්ෂණය.

- වැඩ බිම හෝ සේවා ස්ථානය දියුණු කිරීම සඳහා එම වැඩබිම වන ගෘහස්ථ ශ්‍රමිකයන්ගේ නිවාස වැඩි දියුණු කිරීම සඳහා විශේෂ ණය හා සහනාධාර පහසුකම් ලබා දීම.
- ගෘහස්ථ ශ්‍රමිකයන්ගේ ජල විදුලිය කානු පද්ධති දුරකථන ආදි මූලික යටිතල පහසුකම් ලබා දීම.
- අවදානමට ලක්විය හැකි ළදරුවන් හා වැඩිහිටියන්ගේ අවශ්‍යතාවයන් සුරක්ෂිත වන ලෙස නිවස සේවා ස්ථානය ලෙස වැඩිදියුණු කිරීම හා නව උපායමාර්ග හා පහසුකම් ප්‍රවර්ධනය කිරීම.
- කළමණාකරණ හා පුහුණු සඳහා මාර්ගෝපදේශ ප්‍රවර්ධනය කිරීම.
- ගෘහස්ථ ශ්‍රමිකයන්ට වෘත්තිය සෞඛ්‍යය හා ආරක්ෂාව පිළිබඳව අධ්‍යාපනය ලබා දීම.
- වෘත්තිය සෞඛ්‍යය හා ආරක්ෂාව සහතික වන ලෙස දියුණු කරන ලද තත්ත්ව සහිතව සිය නිවාසය වූ සේවා ස්ථානය සකස් කිරීම ප්‍රවර්ධනය කිරීම.

### v අධ්‍යාපනය හා පුහුණුව සඳහා වූ ප්‍රවේශය

- ගෘහස්ථ ශ්‍රමිකයන් සඳහා විශේෂිත වූ පුහුණු පාසල් හෝ පුහුණු වැඩසටහන් උපායමාර්ගික වශයෙන් වැදගත් වූ ස්ථාන වල ස්ථාපිත කිරීමට පහසුකම් සැපයීම හා ප්‍රවර්ධනය.
- ගෘහස්ථ ශ්‍රමිකයන් සඳහා ව්‍යවසායකත්ව පුහුණුව සඳහා පහසුකම් සැලැස්වීම හා ප්‍රවර්ධනය කිරීම.
- ප්‍රජා පාදක කුසලතා සංවර්ධන වැඩසටහන් පිළිගැනීමට ලක් කිරීම.
- ගෘහස්ථ ශ්‍රමිකයන්ගේ විවිධ පර්ෂද වල අවශ්‍ය කුසලතා හඳුනාගැනීමට කටයුතු කිරීම.
- සැලසුම් සකස් කිරීම නිෂ්පාදන හඳුනා ගැනීම ප්‍රදර්ශනය හා ගුණාත්මක භාවය ආරක්ෂා කිරීම පිළිබඳව පුහුණු වීම් වලට පහසුකම් සැලසීම හා ප්‍රවර්ධනය කිරීම.
- තාක්ෂණික පුහුණුව සඳහා කුෂලතා හා තාක්ෂණය යවත්කාලීන කිරීමට අවශ්‍ය පුහුණුව සඳහා පහසුකම් සැලැස්වීමහා ප්‍රවර්ධනය කිරීම.
- අලෙවිකරණය පිළිබඳ පුහුණු වැඩ සටහන් වලට පහසුකම් සැලැස්වීම හා ප්‍රවර්ධනය.
- ගෘහස්ථ ශ්‍රමිකයන්ගේ වැඩ කටයුතු දියුණු කිරීමට තොරතුරු හා සංනිවේදන තාක්ෂණ සංචිත සඳහා පුහුණු වැඩ සටහන් සඳහා පහසුකම් සැලැස්වීම හා ප්‍රවර්ධනය.

**vi විද්‍යා තාක්ෂණය දැනුම හා තොරතුරු සඳහා වු ප්‍රවේශය**

- යම් වෙළදාමකට හෝ වෘත්තියකට අයත් හා විශේෂයෙන් වැඩි පිරිසක් සම්බන්ධ වු පර්ෂදයන් හඳුනා ගැනිම
- ගෘහස්ථ ශ්‍රමිකයන් පිළිබඳ විවිධ වර්ගයේ සමික්ෂණ පැවැත්විම
- ප්‍රතිපත්ති සම්පාදනයට හා යවක්කාලින කිරිමට උපකාර වන සේ ගෘහස්ථ ශ්‍රමිකයන් පිලිබඳ විවිධ මිනුම් කටයුතු නිරන්තර පදනමකින් සිදු කිරිම
- ගෘහස්ථ ශ්‍රමිකයන් සඳහා වු පාර්ෂවයන් සංවර්ධන කටයුතු සඳහා සහාය දැක්විම
- ගෘහස්ථ ශ්‍රමකයන්ගේ නිෂ්පාදන හා සේවා වල ගුණාත්මකභාවය වර්ධනය කිරිම සඳහා යාන්ත්‍රණය ප්‍රවර්ධනය කිරිම
- ගෘහස්ත ශ්‍රමයිකගේ නිෂ්පාදන හා සේවා වල ප්‍රමිතිය ප්‍රවර්ධනය කිරීම
- ගෘහස්ථ ශ්‍රමිකයින්ට අවශ්‍ය කරනු ලබන තොරතුරු එක්රැස් කිරිම වර්ගීකරණය කිරිම හා බෙදා හැරීම
- ගෘහස්ථ ශ්‍රමීකයන්ට විවිධ අංශ වලට අවශ්‍ය කරනු ලබන දැනුම් පදනම නිර්මාණ කිරීම
- සාම්ප්‍රදායික දැනුම හා කුසලතාවයන් ආරක්ෂා කිරීමටත් ඒවා අදාල පරිදි නව දැනුමෙන් හා කුසලතාවය පෝෂණය කිරීමටත් කටයුතු කිරීම
- ගෘහස්ථ ශ්‍රමිකයින්ට නව යන්ත්‍ර සූත්‍ර හා තාක්ෂණය සඳහා අධි ප්‍රවේශයන් වැඩ කිරිමට විශේෂ ක්‍රම සැකසිම.

**vii ගෘහස්ථ ශ්‍රමිකයන් පිළිගැනිම**

- ප්‍රතිපත්ති සම්පාදනයේ හා සැලසුම් කිරිමෙ විවිධ මට්ටම් වලදි ගෘහස්ථ ශ්‍රමිකයින්ගේ සංවිධාන වල ප්‍රමාණවත් නියෝජනය ඇති කිරීම හා පිළිගැනිම.
- ජාතික ආර්ථිකය තුල ගෘහස්ථ ශ්‍රමිකයින්ගේ නියෝජනය ප්‍රමාණාත්මකව ඇති කිරිම.
- ගෘහස්ථ ශ්‍රමිකයින් රජය විසින් ලියාපදිංචි කරවීමට කටයුතු කිරීම.
- ගෘහස්ථ ශ්‍රමිකයන් පිළිගැනිමට උනන්දු කරවීමට තරග පැවැත්වීම හා සම්මාන ලබාදිමට කටයුතු කිරිම.

**viii ගෘහස්ථ ශ්‍රමිකයින් සංවිධානය කිරීම හා ජාලගත කිරීම**.

- ගෘහස්ථ ශ්‍රමිකයින්ගේ සාමාජිකයින්ට මූලික සංවිධාන වල සමූපකාර හා ජාල සංවිධානය කිරීම සකස් කර දැක්වීම හා ජාලගත කිරීම.
- ගෘහස්ථ ශ්‍රමිකයන්ගේ සාමාජික මූලික සංවිධාන වල සමූපාකාර හා ජාල වල කලාපිය හා ජාතික මට්ටමේ සම්මේලනයන් ප්‍රවර්ධනයන් කිරිම ඇති කිරීමට සහාය දිම.
- ගෘහස්ථ ශ්‍රමිකයන්ගේ ආංශික සංවිධාන, සමූපකාර හා ජාල ඇති කිරිමට සහය දැක්වීම.
- ගෘහස්ථ ශ්‍රමිකයන්ගේ හා ඔවුන්ගේ සංවිධාන වල දත්ත පදනම් හා නාමාවලි සකස් කිරිම හා පවත්වා ගැනිම.
- ගෘහස්ථ ශ්‍රමිකයිනගේ සංවර්ධනය සඳහා Web Portal වැනි නව තාක්ෂණික භාවිතයන් යොදා ගැනිම.

**ix ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා සම්බන්ධතා හා පාර්ශවකාරීත්ව ගොඩනැගිම.**

- ගෘහස්ථ ශ්‍රමික අංශය ශක්තිමත් කිරිම සඳහා බහු පාර්ශවීය සහයෝගිතාවය ඇති කිරිම.
- ගෘහස්ථ ශ්‍රමිකයන්ට සහය දැක්වීම සඳහා CSR ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරිම.
- පාසල් යන වයසේ වූ ළමයින් 100 ක්ම පාසල් යැවීමට කටයුතු කිරිම තුළින් ළමා ශ්‍රමය නැති කිරිමට කටයුතු කිරිම හාදෙමාපියන්ට ළමයින්ට ශ්‍රමය සඳහා යොදා ගැනිමට අවශ්‍යනොවන පරිදි ඔවුන්ගේ ආදායම වැඩ කිරිමට කටයුතු කිරිම.
- ගෘහස්ථ ශ්‍රමිකයින් සඳහා ලබා ගත හැකි රජයේ සේවාවන් ලබා ගැනිම සඳහා දිගු සේවාවන් රාජ්‍ය අංශයේ ආයතන සමඟ සම්බන්ධතා ඇති කිරිම.
- SAARC කලාපයේ හා ජාත්‍යන්තර වශයෙන් වූ ගෘහස්ථ ශ්‍රමිකයින්ගේ සංවිධාන සමඟ සම්බන්ධතා ගොඩනගාගෙන කටයුතු කිරිම.
- ගෘහස්ථ ශ්‍රමිකයින් පිළිබඳ කටයුතු කරන ජාතික හා ජාත්‍යන්තර සංවිධාන සමග සම්බන්ධතා ගොඩනගා ගැනීම.

**x කාන්තා සවිබල ගැන්වීම.**

- කාන්තා ගෘහස්ථ ශ්‍රමිකයින්ගේ නායකත්වය, ව්‍යවසායකත්වය හා අනෙකුත් කුසලතා වැඩි දියුණු කිරිම.
- කාන්තා ගෘහස්ථ ශ්‍රමිකයින්ට සමාජ, දේශපාලන හා ආර්ථික ක්‍රියාකාරකම් වල නියුතු විම සඳහා පහසුකම් ලබා දෙන පරිසරයක් ඇති කිරිම.

**xi ආපදා සඳහා පෙර සූදානම.**

- අංගික වශයෙන් හා පලාත් පාලන ආයතන මට්ටමින් ආපදා කළමණාකරණ පෙර සූදානම් සැලසුම් ප්‍රවර්ධනය කිරිම.
- ගෘහස්ථ ශ්‍රමිකයින් ආපදාවලට මුහුණ දිය හැකි ශක්තිමත් පිරිසක් බවට පත් කිරිම.

**xii ළමා ශ්‍රමය.**

පාසැල් යන වයසේ වූ ළමයින් 100% ක්ම පාසැල් යැවීමට කටයුතු කිරිම තුළින් ළමා ශ්‍රමය අවම කිරිමට කටයුතු කිරිම හා දෙමාපියන්ට ළමයින්ව ශ්‍රමය සඳහා යොදා ගැනීමට අවශ්‍ය නොවන පරිදි ඔවුන්ගේ ආදායම වැඩි කිරීමට කටයුතු කිරිම.